සැ. යු. - 2022.08.05 වැනි දින පළ වූ අංක 2292 දරන ගැසට් පත්‍රයේ I/II (අ), III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,293 - 2022 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2022.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1378 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1379 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1381 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1384 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1388 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1393 |

සැ. යු. - රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 ජූලි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 සැප්තැම්බර් මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අගෝස්තු මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1377 - B 82371 - 5,403 (2022/08)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ලංසු සඳහා ආරාධනයයි

**පහළ හා නැගෙනහිර දිස්ත්‍රික්කවල ඉවත දමන ලද රේල්පීලි බැහැරකිරීම SRS/F. 7856**

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, පහළ හා නැගෙනහිර දිස්ත්‍රික්කවල ඉවත දමන ලද අඩි 78.258' 0" (දළ වශයෙන්) ක් වූ රේල්පීලි, ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් බැහැර කිරීම සඳහා මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

මෙම ලංසු එක් එක් IPW/ කොටසක් සඳහා වෙන් වශයෙන් ඇගයුම් කොට ප්‍රදානය කරනු ලැබේ.

අදල විස්තර පහත පරිදි වේ.

| | *IPW/කොටස* | *ප්‍රමාණය (දික් අඩි)* | *ස්ථානයන්* |
|---|---|---|---|
| 01. | IPW/FOT | 1480'0" (80 Lbs.) 2025'0" (88 Lbs.) 1495'0" (90A Lbs.) | මරදාන - කොල්ලුපිටිය අතර<br>මරදාන - මහරගම අතර |
| 02. | IPW/MRT | 35,000'0" (90 A Lbs.) | රත්මලාන - පින්වත්ත අතර |
| 03. | IPW/GLE | 3200'0" (80 Lbs.)<br>2800'0" (90A Lbs.) | කහව - උණවටුන අතර |
| 04. | IPW/MLG | 13839'0" (80 Lbs.) | මහව - කලාවැව අතර |
| 05. | IPW/KRA | 6782'0" (80 Lbs.)<br>155'0" (88 Lbs.) | කලාවැව - හබරණ අතර |
| 06. | IPW/COA | 6298'0" (80 Lbs.) | හබරණ - කන්තලේ අතර |
| 07. | IPW/TAN | 548'0" (80 Lbs.) | කන්තලේ - ත්‍රිකුණාමලය අතර |
| 08. | IPW/PLN | 1322'0" (80 Lbs.) | ගල්ඔය - ගල්ලැල්ල අතර |
| 09. | IPW/BCO | 3314'0" (80 Lbs.) | පූනානි - මඩකලපුව අතර |

2. ලංසු භාරගැනීම **2022.08.17** දින **ප. ව. 2.00** ට අවසන් කෙරේ.

3. ආපසු නොගෙවනු ලබන ලේඛන ගාස්තු රුපියල් 23,000 ගෙවීමෙන් 2022.08.16 වැනි දින ප. ව. 3.00 දක්වා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිපත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

4. ලංසු ලේඛනයන්හි සඳහන් පරිදි වූ රුපියල් 1,200,000.00 වටිනාකමින් යුත් ලංසු ඇපකරයන් ලංසු සමග ඉදිරිපත් කළ යුතු ය.

5. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

6. මුද්‍රා, තැබූ ලංසු ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, (ප්‍රසම්පාදන) කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

7. අදාළ ලංසු ලේඛන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කොට බැලිය හැක. වැඩිදුර විස්තර සඳහා කරුණාකර අමතන්න.

දුරකථන අංක : 011- 2438078/2436818
ෆැක්ස් අංකය : 011- 2432044
ඊමේල් : srs.slr@gmail.com,tender2@railway.gov.lk
වෙබ් අඩවිය : www railway.gov.lk

යොමු අංකය :SRS/F. 7856

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

08-59

---

# බඩු බාහිරාදිය විකිණීම්

මගේ අංකය : කො. ම. උ. වෙන්දේසි/2022

**මහෙස්ත්‍රාත් අධිකරණය - කොළඹ කොටුව**

ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය

කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකරුවන් හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2022.08.27 වැනි දිනැති සෙනසුරාදා පෙ. ව. 10.00** ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියෝග කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියේ මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා පුද්ගලයින් තම ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

තිලිණ ගමගේ,
අතිරේක මහෙස්ත්‍රාත්.

2022 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | 2405/15 | රිදී මුදු 02ක් |
| 02. | බී 309/08 | රන් මාලයක් |
| 03. | 7818/17 | KD 5093 අංක දරන මරුටි වර්ගයේ මෝටර් රථය |
| 04. | AR 43709/22 | OPPO වර්ගයේ ජංගම දුරකථනය (විදුරුව බිඳී ඇත) |
| 05. | AR 43710/22 | ඩ්‍රෝන කැමරාවක් |
| 06. | අංක රහිත | ගල් වංගෙඩියක් |

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩය* |
|---|---|---|
| 07. | අංක රහිත | එනසාල් 2 kg පමණ |
| 08. | අංක රහිත | සුදු යකඩ බියර් කෑන් 2ක් |
| 09. | අංක රහිත | පැරණි වතුර මෝටරයක් (මලකඩ කා ඇත) |
| 10. | 12460/19 | ඩ්‍රිල් මැෂින් 01ක් |
| 11. | 16927/20 | ගැල්වනයිස් බෝල්ට් ඇණ සහිත බෑගය |
| 12. | 18057/20 | නිල් පාට නොකියා නම සඳහන් බෑග්සීල් කිරීමේ යන්ත්‍රය |
| | | නිල් පැහැති ලිට්‍රෝ වර්ගයේ 12.5 ගෑස් සිලින්ඩර 02ක් |
| | | බට රහිත යකඩ ගෑස් ලිපක් |
| | | බලය සහ රෙගියුලේටරය සහිත ගෑස් ලිප් දෙකක් |

08-84

---

**මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණය**

මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ වන වාහන 08 ක් **2022 අගෝස්තු මස 27 වැනි දින පෙ. ව. 9.30** ට මෙම අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් වන කිසියම් වාහනයක් සම්බන්ධයෙන් හිමිකම් දැක්වීමට අපේක්ෂා කරන තැනැත්තන් වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.30 ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කිරීමට අදාල සාධක රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට නියමිත වාහන පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම අයිතමයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් ලබා ගන්නා සියලුම වාහන සඳහා ගෙවීම් එම අවස්ථාවේ දී ම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවා එදින ප. ව. 3.00 ට පෙර භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

05. වාහන මිලදී ගන්නා සෑම තැනැත්තෙකු ම ස්වකීය ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

ශ්‍රිනිත් විජේසේකර,
මහෙස්ත්‍රාත්,
මහනුවර.

2022 ජූලි මස 08 වැනි දින,
මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2022.08.27 දිනට මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ වෙන්දේසි කිරීමට නියමිත වාහන**

| අනු. අංකය | නඩු අංකය | වාහන අංකය | වාහන වර්ගය | විස්තරය |
|---|---|---|---|---|
| 01. | B 58563/20 | WPHL 0831 | TATA වර්ගයේ බස් රථය | ලියාපදිංචි කළ නොහැක. අමතර කොටස් සඳහා පමණි |
| 02. | B 59444/21 | CP BBN 2886 | BAJAJ වර්ගයේ යතුරු පැදිය | ලියාපදිංචි කළ හැක. |
| 03. | B 36964/15 | CP TH 7608 | BAJAJ වර්ගයේ යතුරු පැදිය | |
| 04. | 25250/18 | WP QT 6587 | BAJAJ වර්ගයේ ත්‍රීරෝද රථය | |
| 05. | 53515/21 | SG TY 5686 | BAJAJ වර්ගයේ යතුරු පැදිය | |
| 06. | 17881/17 | WP TL 0450 | TVS වර්ගයේ යතුරු පැදිය | |
| 07. | 99276/15 | 132 - 1168 | YAMAHA වර්ගයේ යතුරු පැදිය | |
| 08. | 18227/17 | CPJW 9955 | TATA වර්ගයේ ලොරි රථය | |

08-58

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ**

2023 වර්ෂය සඳහා රා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම්වල **2023 ජනවාරි මස 01 වැනි දින සිට 2023 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා** තනි අයිතියට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ම ඉදිරිපත් කළ යුතු ය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතු ය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකි ය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර, වගකීම් පැහැරහැරි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැර හැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතුන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාමලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

තව ද, සුරාබදු බලපත්‍ර දැරීම යටතේ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ රක්ෂාවේ නියුක්ත වීම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැලැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටක දී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ දෙවසර ඇතුළත සුරාබදු

ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් (රු. 5,000/-) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමඟ ය. ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන නිශ්චල දේපළ පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහළවකට (15%) නොඅඩු විය යුතු ය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

තව ද, වත්කම් සහතිකයේ මුල් පිටපත දිසාපතිවරයෙකු/ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවක දී එම නිලධාරියා විසින් ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර, ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතු ය. එක දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවෙකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන් ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර, ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහතිකය ඇමුණූ ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු ය. (මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ *ගැසට් නිවේදනයේ* පස්වන (5) ඡේදයේ කරුණු අදාළ වේ.)

05. සීල් තබන ලද කවරයක බහාලූ එක් එක් ටෙන්ඩර්පත ඇතුළත් කවරයේ උඩ වම් පස කෙළවරේ "අංක .......................... දරන රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය - කොළඹ" යනුවෙන් සඳහන් කර (අ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, හෝ (ආ) ලියාපදිංචි තැපෑලෙන් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් රා තැබෑරුම් සඳහා බලපවත්වනු ලබන කොන්දේසි යටතේ දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී කාර්යාලයට පැමිණ සිටිය යුතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු ය.

07. මිලට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර, ටෙන්ඩර්කරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින්, විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල් ආපසු දීම සහ ඉහත සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ආපසු ගෙවනු ලැබේ.

08. 2022 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේ දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැළකිය යුතු ය.

09. ලැබී ඇති සියලුම ටෙන්ඩර් පත්‍රයන් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීමට හෝ ලැබී ඇති සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

10. මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී අංක 207 හා 1982 අගෝස්තු මස 20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද තොටුපල් රේන්ද විකිණීම යටතේ වූ රා රේන්ද විකිණීමේ කොන්දේසි අදාළ කරගත යුතු ය.

අනුමත කරන ලද කොන්දේසි හා ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාගවෙමින් පවතින එෆ්. ආර්. 383/2015 දරන මූලික අයිතිවාසිකම් නඩුවට අදාළ ව නියම කර ඇති කොන්දේසි අනුව අදාළ කර ගත යුතු රා රේන්ද සීමා මායිම් සහිත රා තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ :

උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා බලපවත්වනු ලබන පොදු කොන්දේසි -

* තැබෑරුම විවෘත කරන වේලාව පෙ. ව. 10.00 සිට ප. ව. 2.00 දක්වා හා ප. ව. 5.00 සිට ප. ව. 9.00 දක්වා
* තැබෑරුම වසන වේලාව ප. ව. 2.00 සිට ප. ව. 5.00 දක්වා වේ.
* ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 5,000 කි.
* ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2022.09.14 වැනි දින පෙ. ව. 10.30 වේ.
* රා තැබෑරුම් විකුණන දිනය 2022.09.14 වැනි දින පෙ. ව. 10.45 වේ.

නාලක රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2022 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *(ඒ)* *අනුක්‍රමික අංකය* | *(බී)* *ප්‍රදේශය* | *(සී)* *ප්‍රාදේශික ප්‍රදේශය* *(තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* |
|---|---|---|
| 01 | අංක 01 කොට්ඨාසය කොටහේන බටහිර (කොටබෝම්) | *උතුරට* : ස්කිනර් පාරේ දකුණු පෙදෙස හන්දියේ සිට කොටබෝම් වීදියේ හංදියට සහ ලැස්කිරන් වීදියේ හංදිය දක්වාත් ය.<br><br>*නැගෙනහිරට* : ලැස්කිරන් වීදියේ සිට බටහිර පැත්ත ස්කිනර් පාරේ (දකුණු) හංදියේ සිට පෙදෙස හා ජම්පටා වීදිය<br><br>*දකුණට* : එහි හංදියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස කොටබෝම් වීදිය සහ ලැස්කිරන් වීදියේ හංදිය දක්වා පෙදෙස සහ<br><br>*බටහිරට* : එකී හංදියේ සිට කොටබෝම් වීදියේ නැගෙනහිර පෙදෙස ජම්පටා වීදියේ හංදියේ සිට ස්කිනර් පාර (උතුරට) හංදිය දක්වා වූ පෙදෙසත් ය. |
| 02 | අංක 02 කොට්ඨාසය කොටහේන (ස්කිනර් පාර) | එම හංදියේ සිට උතුරු ස්කිනර් පාරේ උතුරු පෙදෙස පිකරින් පාරේ සහ කොටහේන වීදියේ හංදිය දක්වා වූ පෙදෙස |
| 03 | අංක 03 කොට්ඨාසය මෝදර | (ඒ) ඉහළ වීදියේ ප්‍රදේශය ඇන්ඩෘ පෙදෙසේ හංදිය දක්වා අලුත් මාවත පාර සහ ශාන්ත ඇන්ඩෲ පාරේ හංදිය දක්වා,<br>(බී) ශාන්ත ඇන්ඩෲ පාර පෙදෙසේ හංදිය දක්වා ඉහළ ශාන්ත ඇන්ඩෲ පෙදෙසේ සහ මාෂන් වීදියේ හංදිය දක්වා,<br>(සී) මෝදර වීදියේ ප්‍රදේශ සහ එහි හංදිය දක්වා, මාෂන් වීදියේ සහ මාදම්පිටිය පාරේ හංදිය දක්වා,<br>(ඩී) ශාන්ත ජේම්ස් වීදියේ දෙපස එහි හංදි දක්වා මෝදර වීදියේ සහ අලුත් මාවත පාරේ හංදිය දක්වා,<br>(ඊ) අලුත් මාවත පාරේ දෙපස සහ එහි හංදිය දක්වා, එහි පටුමග සහ පහළ ශාන්ත ඇන්ඩෲ පෙදෙසේ හංදිය දක්වාත් ය. |

| *(ඒ)* *අනුක්‍රමික අංකය* | *(බී)* *ප්‍රදේශය* | *(සී)* *ප්‍රාදේශික ප්‍රදේශය* *(තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* |
|---|---|---|
| 04 | අංක 04 කොට්ඨාසය මාදම්පිටිය (ෆර්ගියුෂන් පාර) | *උතුරට* : ෆර්ගියුෂන් පාර, දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ ගඟ දක්වා<br>*නැගෙනහිරට* : ලූකස් පාරේ බටහිර පෙදෙසේ සිට හංදිය දක්වා, ෆර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ හංදිය දක්වා<br>*දකුණට* : මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට හන්ධිය දක්වා, ලූකස් පාර හංදිය දක්වා<br>*බටහිරට* : දානියෙල් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට හංදිය දක්වා මාදම්පිටිය පාරේ සහ හීන මුල්ල පටුමගේ හංදිය දක්වාත් ය. |
| 05 | අංක 05 කොට්ඨාසය මාදම්පිටිය | *උතුරට* : ෆර්ගියුෂන් පාරේ දකුණු පෙදෙසේ සිට හංදිය දක්වා, ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ හංදිය දක්වා,<br>*නැගෙනහිරට* : නාගලගම් වීදියේ දකුණු පෙදෙසේ සිට හංදිය දක්වා, ෆර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ හංදිය දක්වා,<br>*දකුණට* : මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට හංදිය දක්වා, නාගලගම් වීදියේ සහ ලූකස් පාරේ හංදිය දක්වා,<br>*බටහිරට* : ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට හංදිය දක්වා, මාදම්පිටිය පාරේ සහ ෆර්ගියුෂන් පාරේ හංදිය දක්වාත් ය. |

11. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

12. *වැදගත්* .- **2022.09.14** වැනි දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද **2022.10.14 වැනි දින පෙ. ව. 10.30** ට නැවත විකුණනු ලැබේ.

08-95/1

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය අවලංගු කිරීම

ඇමෙරිකා එක්සත් ජනපදය, CA 93711, ෆ්‍රෙස්නෝ, නෝර්ත් වැන් නෙස් බුලවාඩ්, අංක 5332 දරන ස්ථානයේ, පදිංචි වෛද්‍ය දිනේෂි ලියනගේ (ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍ර අංක M 2207514) වන මම ඇමෙරිකා එක්සත් ජනපදය, ෆ්‍රෙස්නෝ ප්‍රාන්තයේ, කැලිෆෝනියාවේ ප්‍රසිද්ධ නොතාරිස් එලිස් එස්. මොඑක් විසින් සහතික කළ 2011.10.31 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් කෝට්ටේ, මාදිවෙල, සුහද මාවත, අංක 22/8 දරන ස්ථානයේ පදිංචි වෛද්‍ය අනීෂ බුද්ධික මොල්ලිගොඩ ලියනගේ (ජාතික හැඳුනුම්පත් අංක 731970025 V) වෙත පවරන ලද බලය මෙම දැන්වීමේ දින සිට බලපැවැත්වෙන පරිදි මින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

වෛද්‍ය දිනේෂි ලියනගේ.

08-65

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

සමාගමේ නම : සීමාසහිත ඩීආර් ටිලිත් එක්සෙල් (පෞද්ගලික) සමාගම

සමාගමේ අංකය : පීවී 00258005

ලියාපදිංචි ලිපිනය : අංක 69/3 ගංගාරාම පාර, පැලෑන, වැලිගම, තැපැල්, 81000

සමාගම් අධ්‍යක්ෂ.

08-74

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත සෝල්ට් සර්ෆ් හවුස් (පෞද්ගලික) සමාගම
සමාගමේ අංකය : PV 00258050
ලියාපදිංචි ලිපිනය : අංක 69/3, ගංගාරාම පාර, පැලෑන, වැලිගම, තැපැල්, 81000.

සමාගම් අධ්‍යක්ෂ.

08-75

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත ෂැන්ටේ (පෞද්ගලික) සමාගම
සමාගමේ අංකය : PV 00246939
ලියාපදිංචි ලිපිනය : අංක 11/7, විජය මාවත, පළමුවන පටුමග, මිනුවන්ගොඩ.

කේ. කේ. ඩී. රොසිටා ෆෙඩ්‍රික්,
සමාගම් ලේකම්.

08-76

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත ගෝල්ඩන් වෝටර් ඩ්‍රොප් (පෞද්ගලික) සමාගම
සමාගමේ අංකය : PV 00249505
ලියාපදිංචි ලිපිනය : අංක 61/B, පැලපිටියාගොඩ, තෙඹුවන, කළුතර, තැපැල් 12008

කේ. කේ. ඩී. රොසිටා ෆෙඩ්‍රික්,
සමාගම් ලේකම්.

08-77

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඕස්ට්‍රේලියාවේ, VIC 3030, වෙරිබි, කූප් වීදියේ, අංක 8/8-10 හි කාරියවසම් ගම්හේවගේ දිනුකී ඇකියුලනී ද සිල්වා නොහොත් දිනුකී ඇකියුලනී ද සිල්වා (ජා. හැ. අංක 826711833V සහ ශ්‍රී ලාංකික ගුවන් බලපත් අංක N 5157396) වන මා විසින් 2020 ක් වූ අගෝස්තු මස 29 වන දින ඕස්ට්‍රේලියාවේ දී අත්සන් කොට කැළණිය, වරාගොඩ, විරසිංහ මාවතේ, අංක 3 හි නිමල්කා ස්විනීතා ද සිල්වා විවාහයට පෙර වික්‍රමරත්න යන අයට බලය පවරා ඇති විදේශ ඇටර්නි බලපත්‍රය මෙයින් සම්පූර්ණයෙන් ම අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ගම්හේවගේ දිනුකී ඇකියුලනී ද සිල්වා.

08-82/1

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වැල්ලවත්ත, දුම්රියපොල පාරේ, අංක 17 හි සවක්ත් අලී ෆයිසාල් රහුමාන් (ජා. හැ.අංක 700382575 V) වන මා විසින් අංක 4078 හා 2016 ක් වූ ජනවාරි මස 29 වැනි දින අත්සන් කොට වැල්ලවත්ත, දුම්රියපොළ පාරේ, අංක 17 හි රෙහියානා ෆයිසාල් (ජා. හැ. අංක 846910069 V) යන අයට බලය පවරා ඇති ඇටර්නි බලපත්‍රය මෙයින් සම්පූර්ණයෙන් ම අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

සවක්ත් අලී ෆයිසාල් රහුමාන්.

08-82/2

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

හෝමාගම, දීපංගොඩ, අංක 63 පදිංචි මංගල මනෝජ් ධර්මප්‍රිය සූරියප්පෙරුම වන මම රෙජිස්ට්‍රාර් ජෙනරාල් බස්නාහිර කලාප කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර ලියාපදිංචි දින පොත් 102 කාණ්ඩයේ 89 පත්‍රිරුවේ 5864 දින පොත් අංකය යටතේ 2012.08.23 ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය 2022.02.28 දින සිට අවලංගු කර ඇති බව මෙයින් දන්වා සිටිනු ලැබේ. ඒ අනුව හෝමාගම, දීපංගොඩ, අංක 63 දරන තැන පදිංචි ඉද්දමල්ගොඩ ආරච්චිගේ නදීශානි තිලංකා ඉද්දමල්ගොඩ ආරච්චි තවදුරටත් මාගේ ඇටෝර්නි බලකරු නොවන බව ප්‍රකාශ කරමි.

මංගල මනෝජ් ධර්මප්‍රිය සූරියප්පෙරුම.

08-88

### ඇටර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 06, ෆසල්ස් පටුමගෙහි අංක 86 - 1/1 හි පදිංචි කොළඹ 06 වැල්ලවත්ත ඇරෙතුසා පටුමගේ අංක 46 - 3/2 දරන ස්ථානයේ දැනට පදිංචිව සිටින

අයි. සිවඥානසුන්දරම් තයාලන් (ජා. හැ. අංක 522682187 V) වන මා විසින් බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ 06, ෆසල්ස් පටුමගේ අංක 86- 1/1 හි පදිංචි, කොළඹ 06, වැල්ලවත්ත ඇරෙතුසා පටුමගේ අංක 46 - 3/2 දරන ස්ථානයේ දැනට පදිංචිව සිටින සුමිත්‍රා තයාලන් (ජාතික හැඳුනුම්පත් අංක 586271393V දරන) යන අය වෙත ප්‍රදානය කරන ලද, ප්‍රසිද්ධ නොතාරිස් එස්. රාජකුලේන්ද්‍රන් විසින් ලියා සහතික කරන ලද 2014 මාර්තු 25 වැනි දින ලියාපදිංචි කර ඇති අංක 1592 දරන, විශේෂ ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කර අවලංගු කරන ලද බවත් එකී ඇටර්නි බලකාරිය විසින් මා සඳහා හෝ මා වෙනුවෙන් එලබෙනු ලබන කවර හෝ ගනුදෙනුවකට මා විසින් වගකීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු ජනතාවත් මෙයින් දැනුම් දෙමි.

අයි. සිවඥානසුන්දරම් තයාලන්.

08-89

---

### විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිට්ටඹුව, කොළඹ පාර, අංක 586 හි පදිංචි කෞෂල්‍යා ගංගානි චන්ද්‍රතිලක (ජා. හැ. 965581855 V) වන මා විසින් වතුරුගම, කන්නිමහර, අංක 296/2/B ලිපිනයෙහි පදිංචි නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් එච්. එච්. ඩී. එල්. දර්ශනී එම් යාපා අබේවර්ධන විසින් 2021.02.27 දිනැතිව අංක 165 යටතේ ලියා සහතික කර නිට්ටඹුව, මඩුවේගෙදර, අංක 60 ලිපිනයෙහි පදිංචි තිලකරත්නලාගේ ආරියමාලා (ජා. හැ. 43311331 V) වෙත පවරන ලද බවට සඳහන් එකඟ නොවූ අවිධිමත් විශේෂ ඇටර්නි බලපත්‍රය 2022.07.25 වැනි දින සිට මෙයින් අවලංගු කරන ලබන බව ශ්‍රී ලංකා ජනරජයට සහ සියලු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

කෞෂල්‍යා ගංගානි චන්ද්‍රතිලක.

08-90

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 06, මුවර් පාර, ක්‍රවුන්කෝට් මහල් නිවාස සංකීර්ණයේ (අපාර්ට්මන්ට්) අංක 52 - 5/1 හි පදිංචි ජයකුමාර් තංගවේලු (ජාතික හැඳුනුම්පත් අංක 473482797 V) වන මාගේ නාමයෙන් 2015.09.16 වැනි දින ලියා සහතික කරන ලද දින දිනපොත් අංක 2912 හා ෆෝලියෝ 32 හා වොලියුම් 08 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, මා සඳහා සහ මා වෙනුවෙන් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වගකීම භාර ගැනීමක් සිදු නොකරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුවට සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයකුමාර් තංගවේලු.

08-91

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සමාගමේ නම 2022.06.16 දින සිට වෙනස් කිරීමයි.

සමාගමේ පෙර නම : එල් ඕ එල් සී ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංස් ෆයිව් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 00245492
සමාගමේ ලියාපදිංචි ලිපිනය : 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.
සමාගමේ නව නාමය : අයි පේ සිලෝන් (පීවීටී) එල්ටීඩී

සමාගම් ලේකම්වරු.

08-93

---

### දැනුම් දීමයි

## HSENID BUSINESS SOLUTIONS PLC
## (PQ 00245385)

වාර්ෂික මහා සභා රැස්වීම

HSENID BUSINESS SOLUTIONS PLC (PQ 00245385) සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම (AGM), 2022 ජුලි 27 දිනැති රැස්වීම දැන්වීමේ ප්‍රකාර එදිනට නියමිත කටයුතු කිරීම සඳහා 2022 අගෝස්තු මස 25 වැනි බ්‍රහස්පතින්දා සවස 2.00 ට කොළඹ 02, නවම් මාවතේ අංක 50 දරන ස්ථානයේ සිලෝන් චේම්බර් ඔෆ් කොමර්ස් හිදී පවත්වනු ලැබේ.

රැස්වීම සහ න්‍යාය පත්‍රය පිළිබඳ සවිස්තරාත්මක දැනුම්දීම, පෙරකලාසිය සහ කොටස්කරුවන් වෙත නිකුත් කරනු ලැබූ චක්‍රලේඛය සඳහා කරුණාකර කොළඹ කොටස් හුවමාරුවේ (https://www.cse.lk) වෙබ් අඩවිය සහ සමාගමේ වෙබ් අඩවිය (https://hsenidbiz.com) වෙත පිවිසෙන්න.

කොළඹ කොටස් වෙළෙඳ පොළ, 2022 මැයි 27 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 4 අනුව සමාගමෙහි වාර්ෂික වාර්තාවල මුද්‍රිත පිටපත් මෙම වසරේ දී ලබා නොදෙන බව කාරුණිකව දන්වා සිටියි. කිසියම් ගැටලුවක් වේ නම් කරුණාකර දිමුත් මධුවන්ති මෙනවිය දුරකථන අංක 011 4621111 ඔස්සේ කාර්යාල වේලාවන් තුළ අමතන්න.

Hsenid Business Solutions PLC අධ්‍යක්ෂ මංඩලයේ නියෝගයෙන්,

කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

2022 අගෝස්තු මස 05 වැනි දින.

08-111

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

2022 ජූලි මස 29 වැනි දින සිට බලපවත්වන පරිදි කිංග්ස් කාඩියැක් හොස්පිටල් (පීවීටී) එල්ටීඩී සහ කිංග්ස් හොස්පිටල් කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් සමග ඒකාබද්ධ කළ බවත් 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (1) (අ) සඳහන් වන පරිදි ඒකාබද්ධ සහතිකය නිකුත් කර ඇති බවත් 2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 242 ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ සමාගමේ නම : කිංග්ස් හොස්පිටල් කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්
ඒකාබද්ධ සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 18 ඒ, මුහන්දිරම් ඊ. ඩී. දාබරේ මාවත, නාරාහේන්පිට, කොළඹ 05.
ඒකාබද්ධ කළ දිනය : 2022 ජූලි මස 29 වැනි දින,
ඒකාබද්ධ සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 6109

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

08-113

---

## ෆ්රොන්ටියර් ඔටෝමෝටිව් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 11389

ඇවරකරුගේ ඉල්ලා අස්වීමේ සහ නිදහස් කිරීමේ දැන්වීම

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ෆ්රොන්ටියර් ඔටෝමෝටිව් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 65, කිරුළ පාර, කොළඹ 05 |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | 84/2019/CO |
| ඇවරකරුගේ නම | : | ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් |
| ලිපිනය | : | 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04 |
| ඇවරකරුගේ ඉල්ලා අස්වීමේ සහ නිදහස් කිරීමේ දිනය | : | 2022.06.20 |

08-103

**නිවේදනයයි**

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 5 (3) (ආ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද තාවකාලික අනුමැතිය අනුව යමින්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමෙහි සමාගම් නාමය වර්ෂ 2022 ජූලි මස 12 වැනි දින වෙනස් කළ බව මෙසේ නිවේදනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ පෙර පැවති නම | : | ඇසට්ලයින් ලීසිං කම්පනි ලිමිටඩ් |
| සමාගමේ ලියාපදිංචි අංකය | : | පී බී 82 |
| ලියාපදිංචි ලිපිනය | : | අංක 120, 120ඒ, පන්නිපිටිය පාර, බත්තරමුල්ල |
| සමාගමේ නව නම | : | ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් |

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

ඇසට්ලයින් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-115

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**කොළඹ දිස්ත්‍රික්කය - මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රටබීම තැබෑරුම් සඳහා රේන්ද විකිණීම - 2023 වර්ෂය

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් ප්‍රාදේශීය ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2023 ජනවාරි මස 01 වැනි දින සිට 2023 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ලද ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ :

1. 1982.08.20 වැනි දින හා අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීම් කොන්දේසිය ;
2. සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මාර්ගයෙන්, රු. 5,000 ක මුදලක් තැන්පත් කළ බවට ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ටෙන්ඩර් පත්‍ර එවිය යුතු ය. එම වත්කම් සහතිකයන්හි උපලේඛනයේ ඇතුළත්, එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම්, එම වත්කම් සහතිකය නිකුත් කළ දින සිට අවුරුදු පහක් (05) වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගුවන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයේ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතු ය. ''2023 වර්ෂයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 09 දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි.'' ටෙන්ඩර් පත්‍ර 2022.09.20 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසන් වේලාවේ දී, මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

04. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේ ම, ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, නියම කරනු ලබන මුදල්, තැන්පත් ඇප මුදල වශයෙන් මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට, ඔහුගේ ටෙන්ඩර් පත්‍රය, පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කාලයේ දී තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල් අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම් අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසිදු හේතුවක් නොදක්වා ම, එකක් හෝ සියලු ම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් සතු වේ.

07. මෙම විදේශ මත්පැන් තැබෑරුම, මොරටුව මහ නගර සභා, කොට්ඨාස අංක 09 හි පවත්වාගෙන යා යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිල්ලක් සපයා ගත යුතු අතර, එකී ගොඩනැගිල්ල සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයාදීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැළකිය යුතු ය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ප්‍රදේශයේ තැබෑරුම් අයත් විය යුතු ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල (රු.) | ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව | විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 01 | අංක 9 කොට්ඨාසය, මොරටුව මහ නගර සභාව | මොරටුව මහ නගර සභාවේ අංක 09 කොට්ඨාසයේ ගාලු පාරේ බටහිර පෙදෙසේ පිහිටි මොරටුවැල්ල ගමේ පමණක් | පෙ. ව. 11.00 සිට සහ ප. ව. 5.00 සිට | ප. ව. 2.00 දක්වා<br>ප. ව. 8.00 දක්වා | 5,000 | පෙ. ව. 10.30 | 2022.09.20 |

09. වැඩි විස්තර මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

10. **වැදගත් .** - මෙම විදේශ මත්පැන් රේන්දය **2022.09.20** වැනි දින විකිණීමට නොහැකි වුවහොත් **2022.10.20** වැනි දින **පෙ. ව. 10.30** ට එය නැවත විකුණනු ලැබේ.

ඉෂංකා ඩී. කේ. උඩවත්ත,
ප්‍රාදේශීය ලේකම් - මොරටුව.

2022 ජූලි මස 21 වැනි දින,
මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-57

## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ

### 2023 වර්ෂය සඳහා රටබීම තැබෑරුම් රේන්ද විකිණීම

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශික ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක **2023 ජනවාරි මස 01 වැනි දින සිට 2023 දෙසැම්බර් මස 31 වැනි දින** දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

- * 1982 අගෝස්තු මස 20 වැනි දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි,
- * සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. සෑම ටෙන්ඩර්පත්‍රයක් ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු ය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකි ය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර, වගකීම් පැහැර හැරි කොන්ත්‍රාත් නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැර හැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතුන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි. තව ද, සුරාබදු බලපත්‍ර දැරීම යටතේ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ රක්ෂාවේ නියුක්ත වීම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැළැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටක දී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ වසර ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් (රු. 5,000) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ය. ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන නිශ්චල දේපළ පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහළොවකට (15%) නොඅඩු විය යුතුය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

තව ද, වත්කම් සහතිකයේ මුල්පිටපත දිසාපතිවරයකු/ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවක දී එම නිලධාරියා විසින් ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතු ය. එක දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන් ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහතිකය ඇමුණූ ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු ය. (මේ සම්බන්ධව කටයුතු කිරීමේදී රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ ගැසට් නිවේදනයේ පස්වන (5) ඡේදයේ කරුණු අදාළ වේ.)

05. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර්පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ "2023 වර්ෂයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ............................ දරන රට බීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය"යි යන්න සඳහන් ටෙන්ඩර්පත්‍ර **2022.09.14 වැනි දින පෙ. ව. 10.30** ට පෙර ලැබෙන සේ කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු යි.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේ ම ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රට බීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතුය.

07. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලංසුකරු විසින් හෝ සම්පූර්ණ මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

08. ලැබී ඇති සියලුම ටෙන්ඩර් පත්‍රයන් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීමට හෝ ලැබී ඇති සියලුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

09. 2022 වර්ෂය සඳහා දැනට විදේශීය මත්පැන් රේන්දය පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

10. මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී අංක 207 හා 1982 අගෝස්තු මස 20 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ලද තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම යටතේ වූ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි අදාළ කරගත යුතු ය.

අනුමත කරන ලද කොන්දේසි හා රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ.

උපලේඛනයේ සඳහන් රටබීම තැබෑරුම් සඳහා බල පවත්වනු ලබන පොදු කොන්දේසි :-

* තැබෑරුම විවෘත කරන වේලාව පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා හා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා වේ.
* තැබෑරුම වසන වේලාව ප. ව. 2.00 සිට ප. ව. 5.00 දක්වා වේ.
* ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 5,000 කි.
* ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2022.09.14 වැනි දින පෙ. ව. 10.30 වේ.
* රට බීම තැබෑරුම් රේන්ද විකුණන දිනය 2022.09.14 වැනි දින පෙ. ව. 10.45 වේ.

**උපලේඛනය**

| *(ඒ)*<br>*අනුක්‍රමික අංකය* | *(බී)*<br>*ප්‍රදේශය* | *(සී)*<br>*ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත්විය යුතු පෙදෙස)* |
|---|---|---|
| 01. | අංක 01 කොට්ඨාසය කොටුව | *උතුරට :* ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට පල්ලිය වීදියේ මධ්‍ය රේඛාව හා ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගිය විට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට නැගෙනහිර දිශාවට ගිය විට එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා කෙළින් වීදියේ මධ්‍ය රේඛාව හමුවන බාන් ඔරලෝසු කණුව පිහිටි හන්දියේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද,<br><br>*නැගෙනහිරට :* එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද, |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත්විය යුතු පෙදෙස) (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) |
|---|---|---|
| | | *දකුණට* : දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හා ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට යෝර්ක් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට යෝර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද,<br><br>*බටහිරට* : ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද වේ. |
| 02. | අංක 02 කොට්ඨාසය මෝදර | *උතුරට* : පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හා ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට ඩිලාසල් වීදියේ මධ්‍ය රේඛාව හා මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හමුවන කෝවිල හන්දියේ පිහිටි මධ්‍ය ලක්ෂ්‍යයේ සිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද,<br><br>*නැගෙනහිරට* : මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට මෝදර පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට අළුත්මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමුල්ල කන්ද හතරමන් හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*දකුණ* : මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමුල්ල කන්ද හතරමන් හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂ්‍යයේ සිට අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*බටහිරට* : අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හා පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට පහළ ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට ශාන්ත ඇන්ඩෘ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද වේ. |

11. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

12. *වැදගත්* .- **2022.09.14** වැනි දින විකිණීමට නොහැකි වූ රට බීම මත්පැන් තැබෑරුම් රේන්ද **2022.10.14** වැනි දින **පෙ.ව. 10.30** ට නැවත විකුණනු ලැබේ.

නාලක රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2022 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-95/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - බොරලැස්ගමුව ශාඛාව

### 1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් ලියා සහතික කරන ලද අංක 2134 හා 2007.11.06 වැනි දින දරන උකස් බැඳුම්කර සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් සියල්ල ලියා සහතික කරන ලද 2014.10.24 , 2015.06.05, 2016.11.22 සහ 2016.10.06 දින දරන උකස් සාධන පත්‍ර මගින් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල ණයකරු වශයෙන් නාගලමුල්ලේ ගමගේ ලසන්ත සනත්චන්ද්‍ර ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපළ

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **2022 අගෝස්තු මස 30 වැනි දින පෙ. ව. 11.30 ට** දේපළ පිහිටි ස්ථානයේදී මා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කිරිගම්පමුණුව ග්‍රාම නිලධාරි වසම තුළ කිරිගම්පමුණුව ගමේ පිහිටි සර්වේ ජනරාල්වරයා විසින් සහතික කරන ලද කැඩැස්තර සිතියම් අංක 520018 හි කැබලි අංක 06 හි දක්වෙන අංක 0023 දරන ඉඩම ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි පහයි බිංදුවක් (හෙක්. 0.0850) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළුව සියලු දේ ද වේ.

*වැඩි විස්තර සඳහා.-* 2021.07.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2021.08.04 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය. -* මත්තේගොඩ නිවාස යෝජනා ක්‍රමයේ සිට මීටර් 800ක් කිරිගම්පමුණුව පාරෙන් ගොස් පොල්ගස්ඕවිට පාරට හැරී මීටර් 200ක් දුර ගිය විට කහතුඩුවට දිවෙන මාර්ගයේ වම් පැත්තට යාව මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය. -*

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු ය. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 011 2661866, 011- 2661828

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇත. ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු (මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011- 2053286/072-3207533
076-9217329.

08-92

---

## සෙලාන් බැංකුව පීඑල්සී - පොතුවිල් ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පොතුවිල් 11 පදිංචි දීපාල් නිරෝෂ් සදානන්ද හෙවත් තීපාල් නිරෝස් සතානන්ද යන අය බැඳුම්කරු/උකස්කරු වශයෙන් මුදල් ගෙවීම් පැහැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. පෙරිනාපරාජා විසින් සියල්ල සහතික කරන ලද 2013.03.13 දිනැති

උකස් බැඳුම්කර අංක 1742, 2013.09.18 දිනැති 2051, 2015.06.26 දිනැති 2865, 2015.09.15 දිනැති 2914 සහ 2016.06.28 දිනැති 3115 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ **2022 ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින පෙ. ව. 11.00** ට සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව කොළඹ 03, ගාලු පාර, නො. 90 හි පිහිටි සෙලාන් බැංකුව පීඑල්සී පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID - 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කය තුළ, පොතුවිල් පානම්පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක පී/03 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පොතුවිල් 03 පිහිටි බලයලත් මිනින්දෝරු සී. ඊ. ෆිලිප්ස් විසින් සාදන ලද 1952.09.15 දිනැති අංක 805 මිනුම් සැලැස්ම අනුව පාක්කියවත්ත නොහොත් මවුලානා තෝට්ටම් නමැති විශාල ඉඩමේ කොටසක් වන ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට අඩි 104 නැගෙනහිර සිට බස්නාහිරට අඩි 52ක් (උ-නැ. අඩි 104, නැ-බ. අඩි 52) විශාල ඉඩම් කොටස.

බලයලත් මිනින්දෝරු එස්. එම්. කාසිම් විසින් සාදන ලද 2011.07.01 දිනැති අංක 5630 මිනුම් සැලැස්ම අනුව නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කය තුළ, පොතුවිල් පානපෙත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක පී/03 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පොතුවිල් 03 පිහිටි පාක්කියවත්ත නොහොත් මවුලානා තෝට්ටම් නමැති ප්‍රමාණයෙන් පර්චස් විසිතුනයි දශම එකයි එකකි (පර්. 23.11) (හෙක්ටයාර් 0.0585) විශාල ඉඩම් කොටස.

*දේපළට පිවිසීම.* - බැංකු පරිශ්‍රයේ සිට අක්කරපත්තු දෙසට මීටර් 200ක් වම් පසින් ඇති වට්ටිවේල් පාර දක්වා පැමිනෙන්න. පසුව එම වට්ටිවෙල් පාරෙන් මීටර් 300ක් පැමිණි පසු මෙම විෂයගත දේපල වම් පසින් වන්නට පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - 2022.06.17 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, අද, ඩේලි FT සහ තමිලන් පුවත්පත්හි 2022.06.29 දින ද, පල වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරිනි, නීති, 14 මහල, සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 2456478, 011- 2456473.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9, අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකතන අංක : 071 4318252, 011- 2173282.

08-104

---

**කෑගල්ල දිසා අධිකරණයේ දී ය**

ප්‍රසිද්ධ වෙන්දේසියක්

**ගලිගමුව, ඇඳුරාපත ග්‍රාමයේ, පනකාව පාසල් පාරේ පිහිටි රූඩ් 2 පර්චස් 0.40ක් විශාලැති කෘෂිකාර්මික දේපළක්**

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළයේ ගංදොළහ පත්තුවේ ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත ඇඳුරාපාත ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, බලයලත් මිනින්දෝරු කේ. එස්. පණ්ඩිතරත්න විසින් සාදන ලද අක 4804/ ඒ හා 2007 ජනවාරි මස 19 වැනි දින දරන පිඹුර අනුව උතුරින් අංක 6 සහ 8 දරන බිම් කැබලිවලින් නැගෙනහිරින් කම්බි වැටෙන් ඉවුරෙන් එවරට් පෙරේරා විසින් හිමිකම් දක්වා සිටින ඉඩමෙන් සහ ජී ජයනේරිස් විසින් හිමිකම් දක්වා සිටින ඉඩමෙන් දකුණින් ඇළෙන් සහ බස්නාහිරින් අංක 9 බිම් කැබැල්ලෙන් මායිම්වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 2යි පර්චස් දශම හතරයි බිංදුවකින් (රූ. 2, පර්. 0.40) යුක්ත වූද, මිරිහෙල්ලගේ දෙණිය වත්ත යනුවෙන් හඳුන්වන ලබන ඉඩමෙන්

ඉහත කී අංක 4804/ඒ පිඹුරේ නිරූපිත අංක 10 දරන බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙද ා වෙන් කරන ලද හා මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි වෙනත් සියලු දේ ද සමග වේ.

(අ) පළමු නඩු නිමිත්ත මත රු. 2,5000,000.00 ක මුදලක් මත 2014 අප්‍රේල් මස 01 වැනි දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවන තෙක් වර්ෂයකට 24% අනුප්‍රමාණයක් අනුව පොළියක් ද සමග අයකර ගැනීමටත්, නඩුවේ තක්සේරු නඩු ගාස්තු ද වෙන්දේසිය දරන්නට වූ වියදම් සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද, අයකර ගැනීම පිණිස කොළඹ 11, 5 වන හරස් වීදියේ අංක 151 සහ කැගල්ල පරකාව අංක B 71 දරන ස්ථානයන්හි පදිංචි වෙඩික්කාරයාලාගේ සිසිර හේමන්ත කුමාර යන විත්තිකරුට විරුද්ධව කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අංක 21, බ්‍රිස්ටල් වීදිය කොළඹ 01 සහ බණ්ඩාරගම හොරණ පාරේ අංක 101 දරන ස්ථානයේ බණ්ඩාරගම ශාඛාව යනුවෙන් සඳහන් කරනු ලබන හා ශාඛා කාර්යාලයක් හා/හෝ ව්‍යාපාර ස්ථානයක් ඇති පැමිණිලිකරු විසින් කැගල්ල දිසා අධිකරණයේ පවරන ලද අංක MB/1014/2014 දරන නඩුවෙන් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ වර්ෂ **2022 ක්වූ සැප්තැම්බර් මස 02 වැනි දින පෙරවරු 11.30** ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කැගල්ල - පොල්ගහවෙළ ප්‍රධාන මාර්ගයේ 10 වන කි. මී. කණුවෙන් මීටර් 25ක් පමණ එපිට ඇදුරාපත කඩමන්ඩිය අසළින් දකුණට හැරී කොන්ක්‍රිට් කරන ලද පනකාව පාසල් පාරේ මීටර් 200ක් පමණ ගමන් කර වමට හැරී කොන්ක්‍රීට් කරන ලද පාරේ ගමන් කිරීමෙන් පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් ඒ අවස්ථාවේ දී ම වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25%ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු වශයෙන් 2.5% ක් ද,
4. වෙන්දේසිය සඳහා දරන්නට වූ සියළුම වියදම් ද,
5. සෝෂක හා ලිපිකරු ගාස්තු වශයෙන් රු. 4,000ක මුදලක් ද,
6. වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 10,000 ක මුදලක් ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගරු අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ ලියකියවිලි පරීක්ෂා කිරීම පිණිස විමසන්න. කොළඹ 03, ආර්. එල්. ද මැල් මාවතේ, අංක 271 දරන ස්ථානයේ පිහිටි ජුලියස් ඇන්ඩ් ක්‍රීසි නීතිඥ හා නොතාරිස් මහතුන්ගේ දුරකථන අංක 011 4708300 දිගුව 408/393

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011 2873656, 0777672082, ෆැක්ස් 011- 28771184.

08-99